" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / General Telephone - 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/01(2025) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2025.04. 11 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ ලිපිය බස්නාහිර පළාතට අදාල කර ගැනිම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.04.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ ලිපි අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 02/2025 හා 2025.03.26 | රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය 2025 - salary 2025 මෘදුකාංගය මගින් වැටුප් පරිවර්තන ලිපි සැකසීම. |

02. මෙම චක්‍රලේඛ ලිපියෙහි පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ ලිපියෙහි පරිදි කටයුතු කරන ලෙස කාර්යාලයේ ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එස්.එම්.එච්. කුසුම්සිරි,
පරිපාලන නිලධාරි
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092607
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2025

මගේ අංකය : EST-5/04/PCY/0041
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.03.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය 2025 - salary2025 මෘදුකාංගය මගින් වැටුප් පරිවර්තන ලිපි සැකසීම**

2025 අයවැය යෝජනා අනුව, 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 මගින් රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය සඳහා අවශ්‍ය මගපෙන්වීම් සිදු කර ඇත. කෙටි කාලයක් තුල විශාල කාර්ය මණ්ඩලයක් සඳහා වැටුප් සැකසීමේ ක්‍රියාවලියට ආධාරකයක් ලෙස **salary2025** මෘදුකාංගය රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇත.

02. **salary2025** මෘදුකාංගය වෙත පහත පරිදි පිවිසිය හැක.

අ.) **LGN** ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් **10.250.1.112:9006**
ආ.) වෙනත් ජාල ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් **43.224.125.68:9006**

03. ඉහත සඳහන් සබැඳියන් ඔස්සේ ආයතන පිවිසුම **(Institutional Login)** තුලින් **salary2025** මෘදුකාංගය වෙත පිවිසිය හැක. ආයතන සඳහා මේ වන විටත් **MISCO** මෘදුකාංගය වෙත පිවිසීමට ලබා දී ඇති මුරපද**(Password)** මේ සඳහා භාවිත කලයුතු අතර, තම ආයතනයට අදාල මුරපද**(Password)** මේ වනතෙක් ලබාගෙන නොමැති නම් salary.2025.lk@gmail.com වෙත ආයතන ප්‍රධානියා විසින් ඊමේල් පණිවිඩයක් යොමු කිරීම මගින් ආයතනයට අදාල මුරපද**(Password)** ලබා ගත හැකිය.

04. එමෙන්ම තම ආයතනය අදාල ආයතනික පිවිසුම්හි සඳහන් නොවේ නම් ඒ සඳහා නව පිවිසුමක් **(Institutional Login)** ලබා ගැනීම සඳහාද පෙර සඳහන් කර ඇති salary.2025.lk@gmail.com මගින් ආයතනයට අදාල පිවිසුම සඳහා මුරපද**(Password)** ලබා ගත හැකිය.

05. **salary2025** මෘදුකාංගය භාවිත කිරීම සම්බන්ධයෙන් ඇති ගැටලු අවම කිරීම සඳහා, එය භාවිත කිරීම සම්බන්ධයෙන් උපදෙස් සඳහා එහි අතුරු මුහුණතේ ඇති **Help** සබැඳිය ඔස්සේ දක්වා ඇති වීඩියෝ පටය පරිශීලනය කිරීමෙන් මේ සඳහා උපකාර වන තොරතුරු ලබාගත හැකිය.

06. මෙම මෘදුකාංගය හුදෙක් ආයතනවල වැටුප් පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීමේ අරමුණෙන් හඳුන්වා දී ඇති අතර, නිලධරයෙකුගේ වැටුප් පරිවර්තනයෙහි (2025.03.25 දිනැති රාජ්‍ය

පරිපාලන චක්‍රලේඛ 10/2025 හි ඇමුණුම 01) නිරවද්‍යතාවය පෞද්ගලික ලිපිගොනු සමඟ සසඳා බලා එය නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් පසු අත්සන් කිරීම අදාල බලධරයන්ගේ වගකීමක් බව අවධාරණය කරමි.

07. මෙම මෘදුකාංගය භාවිතයෙන් සකසන ලද වැටුප් පරිවර්තනයක් අදාල වැටුප් චක්‍රලේඛ පරීක්ෂා කිරීමේ දී නිවැරදි නොවන බව අනාවරණය වුවහොත් එයට හේතුව පරීක්ෂා කර මෘදුකාංගයේ අවශ්‍ය වෙනස් කිරීම සඳහා වහාම දුරකථන අංක 011-2693374 ඔස්සේ හෝ salary.2025.lk@gmail.com ඔස්සේ හෝ ආයතන අධ්‍යක්ෂ I වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.


එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk